**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2023**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය ව්‍යාචනය**

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරියේ) 62 වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාචනය කල මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද , පූර්ව වර්ෂවලට හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබූ දායක මුදල රු. 77,965,865 ක් සමාලෝචිත වර්ෂයේදී මුදල් පදනමට ගිණුම් ගත කර තිබුණි. | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් සඳහා මාසික විශ්‍රාම වැටුප් ගෙවීම 2011 වර්ෂයේ සිටම ක්‍රමයෙන් ක්ෂය වන දැනට අක්‍රීය තත්ත්වයේ පවතින මෙම අරමුදල උපයෝගී කොට ගෙන සිදු නොකෙරෙන බැවින් විශ්‍රාම වැටුප් ගෙවීම උපචිත පදනම අනුව ගැළපීම් සිදු කරනු නොලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ආදායම් වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් 2023 වර්ෂයේ විශ්‍රාමිකයින් සඳහා රු.932,929,839 ක දායක මුදල් ගෙවා තිබුණි. පළාත් පාලන ආයතන වලින් වර්ෂය තුළ දායක මුදල් ලැබීම් රු.77,965,865 ක් වූ අතර විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවීම් ලෙස එම මුදල දායක මුදල් ලැබීමට එරෙහිව ගිණුම් ගත කර තිබුණද ඒ සම්බන්ධව ගිණුම්වල හෙළිදරව් කිරීම් කර නොතිබුණු අතර එම මුදලින් රු. 16,701,878 ක් පෙර වර්ෂ සඳහා ලැබීම් වුවත් එම වටිනාකම , ඌනතාවය සමුච්චිත අරමුදලට මාරු කිරීම ලෙස ආදායම් වියදම් ගිණුමට ගලපා තිබුණි. | සටහන 02, හි අංක 03 යටතේ ගිණුම් සටහනක් ලෙස ඉදිරිපත් කර ඇති බව. | ආදායම් වියදම් ගිණුමේ දායක මුදල් ලැබීම් හා ගෙවීම්වල ප්‍රතිඵලය දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුදුක්කුඩියිරුප්පු ප්‍රාදේශිය සභාවේ 2018 පෙබරවාරි 12 දින චෙක්පතක් මගින් එවන ලද රු. 858,060ක්වූ දායක මුදල පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීම වෙනුවට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීම හේතුවෙන් එම වටිනාකමින් ලැබිය යුතු දායක මුදල් ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | පුදුක්කුඩියිරුප්පු ප්‍රාදේශීය සභාවෙන් ලද ආවරණ ලිපියෙහි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට යනුවෙන් පමණක් සඳහන්ව තිබීම හේතුවෙන් එම චෙක්පත වැන්දඹු හා අනත්දරු පළාත් ආදායම් ශීර්ෂය යටතේ බැර කර ඇති බව. | නිවැරදි ගිණුම්වලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාතර්ා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|---|
| (අ) ලැබිය යුතු දායක මුදල | 835,735,244 | 114,383,538 | 721,351,706 | 2023 දෙසැම්බර් මස එවන ලද චෙක්පත් 2024 ජනවාරි මස ලැබීම හේතුවෙන් 2023 දෙසැම්බර් මස ගිණුම්ගත නොවීම මත මෙම වෙනස නිරූපණය වන බව. | ශේෂ සනාථ කර ගැනීම තුළින්ලැබිය යුතු දායක මුදල තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) ලැබිය යුතු දායක මුදල | 50,516,885 | 59,725,510 | 9,208,625 | 2023 වර්ෂයේ අවසන් මාස තුනට අදාල මරණ ඉවත් කිරීම 2023 දෙසැම්බර් මස බිල්පතින් සිදුකරන අතර මේ සම්බන්ධව පළාත් පාලන ආයතන වලට දැනුවත් කිරීම 2024 ජනවාරි මස සිදුකරන බැවින් පළාත් පාලන සේවා අරමුදලේ ගිණුම අනුව 2023.12.31 දිනට ශේෂය අඩුවෙන් පෙන්නුම් කෙරෙන බව. | ශේෂ සනාථ කර ගැනීම තුළින්ලැබිය යුතු දායක මුදල තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| ලැබිය යුතු දායක මුදල් | 74,922,370 | ශේෂ තහවුරු කිරීම් | මාසික බිල්පත් මඟින් ත්‍රෛමාසිකව ඒ ඒ ආයතන විසින් ගෙවීමට ඇති මුදල් පිළිබඳ දැනුම්දීමක් සිදුකරනු ලබන අතර මේ වනවිටත් කිසිඳු ආයතනයකින් ගෙවිය යුතු දායක මුදලේ වෙනසක් ඇති බවට දැනුම්දීමක් සිදුකර නොමැති බව. | ශේෂ සනාථ කර ගැනීම තුළින්ලැබිය යුතු දායක මුදල තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශන අනුව පලාත් පාලන ආයතන 303 කින් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂය රු.1,073,077,382 ක් වූ අතර ඉන් 2023 වර්ෂයේ දායක මුදල් ලැබී නොතිබුණු පලාත් පාලන ආයතන සංඛ්‍යාව 81 ක් විය. අදාල ආයතන වලින් අයවිය යුතු දායක මුදල් ශේෂය රු.284,259,658 ක් විය. | පළාත් පාලන ආයතන නිලධාරීන් සම්බන්ධ කරවාගෙන ලැබිය යුතු දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු යොදා ඇති බව හා එම හිඟ දායක මුදල් නිවැරදිව ප්‍රේෂණය කිරීම එම ආයතනයන්ගේද මූලික වගකීමක් වන බව. | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 2016 ජූලි 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 07/2016 දරන චක්‍රලේඛය | 2016 අයවැය යෝජනා අංක 425 හා 426 මගින් පාර්ලිමේන්තුවේ පිළිගත් ක්‍රියාදාමයකට අනුකූලව සියලුම ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පාර්ලිමේන්තු පාලනයට යටත් කිරීම සහතික කිරීම පිණිස මහා භාණ්ඩාගාරය විසින් 2016 ජුනි 11 දින විශේෂ කමිටුවක් පත් කර තිබූ අතර එම කමිටුව විසින් මෙම අරමුදලට අදාල පනත් සංශෝධනය කර වසා දැමිය යුතු බවට යෝජනා කර තිබුණද ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම වාර්තාවේ හිඟ දායක මුදල් අදාල ආයතන වෙතින් ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරන ලෙස දක්වා තිබූ නිර්දේශයද ක්‍රියාත්මක කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් පත් කරනු ලැබූ විශේෂ කමිටුවේ 2017 මාර්තු 31 දිනෙන් නිකුත් කරන ලද කමිටු වාර්තාවට අනුව පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ඇතුළු අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් වසා දැමිය යුතු බවට නිර්දේශ කර ඇත. එසේ වුවත් එකී වාර්තාව සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්ති තීරණයක් ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දීමක් පිළිබඳව මෙතෙක් වාර්තා වී නැති බව. | අරමුදල වසා දැමීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු අතර හිඟ දායක මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,701,878 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 27,070,918 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,369,040 පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට දායක මුදල් ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල යටතේ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින් 04 දෙනෙකු 2016 ඔක්තෝබර් හා 2022 අප්‍රේල් කාලය තුළ මියගොස් තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඔවුන්ගේ නම් පළාත් පාලන සේවා විශ්‍රාමිකයින්ගේ නාම ලේඛනයෙන් ඉවත් නොකර, පළාත් පලාන ආයතන වෙතින් දායක මුදල් අයකර තිබුණි. | අදාල පළාත් පාලන ආයතන වලින් මරණ සහතික ගෙන්වා ගෙන තහවුරු කර ගැනීමෙන් අනතුරුව පළාත් පාලන සේවා විශ්‍රාමිකයින්ගේ නාම ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | කාලීනව මරණ හඳුනාගෙන නාම ලේඛනය යාවත්කාලීන කළ යුතුය. |